චක්‍රලේඛ අංකය -02/2025

මගේ අංකය -සමු/අධි/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප)
ආදිපාද වීදිය,
කොළඹ .01
2025.09.03

බස්නාහිර පළාතේ සමුපකාර දෙපාර්තමේන්තුවේ
සියළුම නිලධාරීන් වෙත.

<u>සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමුපකාර සමිතිවල ධූරවලට පත්වීම.</u>

බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහ එකී දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සමුපකාර සමිති සම්බන්ධයෙන් විගණනය, විමර්ශන, පොත්පත් පරීක්ෂණ, ආරවුල් බේරුම්කරණය ,උපදේශක සේවා සිදු කිරීම, ලියාපදිංචිය අවලංගු කිරීම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

02.ඒ අනුව සමුපකාර සමිතිවල කටයුතු සම්බන්ධයෙන් සෘජු මැදිහත්වීමක් සිදු කල හැකි රාජ්‍ය නිලධාරීන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සක්‍රිය සේවයේ සිටින නිලධාරීන් වේ.

03. එකී නිලධාරීන් ඉහත සඳහන් සමුපකාර සමිතිවල ධූරයන්ට පත්වීම තුලින් බැඳියා පිළිගැටුම් තත්ත්වයන් නිර්මාණය විය හැක. එය සමුපකාර සමිතිවල යහපත් පැවැත්මට අහිතකර ලෙස බලපෑ හැකිය. එම නිසා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ රාජකාරි කරනු ලබන රාජ්‍ය නිලධාරීන්ගේ විවෘතභාවය, විනිවිධභාවය හා අපක්ෂපාතීභාවය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයන්ට මෙන්ම නිලධාරීන්ට සෘජු තීරණ ගෙන විවෘතව කටයුතු කිරීමට අහිතකර තත්ත්වයක් නිර්මාණය වීමේ අවදානමක් ඇති වේ.

04. එම නිසා මින් ඉදිරියට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුමන හෝ තනතුරක සක්‍රිය සේවයේ යෙදී සිටිනු ලබන නිලධාරියෙකු බස්නාහිර පළාතේ කිසිදු සමුපකාර සමිතියක කාරක සභියෙකු/අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත් නොවිය යුතුය. එමෙන්ම දැනට මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු එසේ පත් වී ඇත්නම් මෙම චක්‍රලේඛය නිකුත් කල දින සිට එකී පත්වීම අවසන් වූවාසේ සැලකිය යුතුය.

05. එසේම සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය හා බස්නාහිර පළාතේ විවිධ සේවා සමුපකාර සමිති සම්බන්ධයෙන් අවධානය යොමු කල විට එකී සමිතිවල ප්‍රාදේශීක කාරක සභාවකට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුමන හෝ තනතුරක සක්‍රිය සේවයේ යෙදී සිටිනු ලබන නිලධාරියෙකු පත් නොවිය යුතු අතර දැනට මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු එසේ පත් වී ඇත්නම් මෙම චක්‍රලේඛය නිකුත් කල දින සිට එකී පත්වීම අවසන් වූවාසේ සැලකිය යුතුය.

05. මෙම චක්‍රලේඛයේ විධිවිධාන සමුපකාර නීතියේ විධිවිධාන වලට යටත්ව රාජකාරි පැවරීම් වශයෙන් මා විසින් සිදු කරනු ලබන පත් කිරීම් හා නම් කිරීම් සඳහා අදාල නොවන අතර බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සාමාජිකත්වයෙන් පමණක් සමන්විත සමුපකාර සමිති සඳහාද චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවේ. මේ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කර ඇති 2023.07.24 දිනැති 09/2023 චක්‍රලේඛය මේ සමඟ අවලංගු කරමි.

එම්.ඒ.පී. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
බස්නාහිර පළාත.

පිටපත්
01. ලේකම්, සමුපකාර හා ප්‍රවාහන ආමාත්‍යාංශය-බස්නාහිර පළාත -කරු. දැ.පි
02. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්( කොළඹ/කළුතර/ගම්පහ) -කරු. දැ.පි